සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 03 යි<br>03 மணி நேரம்<br>03 Hours |
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 |

- **I** කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4කට ද, **III** කොටසින් ප්‍රශ්න 1කටද පිළිතුරු සපයන්න. ● පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

අ) I පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

නල්ලූර් ෆෙඩ්රික් කොටුව, කසා තොට, නාච්චදූව වැව, ගල්සොහොන් කනත්ත, වනවාහිනී නදී, යාන් ඔය, මහා නාගහුල, සොරබොර වැව, පල්ලවංක, කනදරා ඔය, සුබරතිත්ථ (ල. 12)

II. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

දිල්ලිය , කල්කටා, ඇලෙක්සැන්ඩ්‍රියාව, වතිකානුව, කොරියානු අර්ධද්වීපය, ගංගා ගඟ (ල. 12)

**ආ)**

I පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. පුරාණ කාලයේ වැව් එල්ලංගාවක් භාරව කටයුතු කළ ප්‍රාදේශීය පාලකයා

B. ලංකාවට පැමිණ මෙහි තොරතුරු සියැසින් දැක බලා ඒ පිළිබඳ වාර්තා ලියා තැබූ ඕලන්ද ජාතික දේවගැතිවරයා

C. මහාවංශයට ලියූ ටීකාව හඳුන්වන නම

D. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජු විසින් ලියන ලද මහා කාව්‍ය (ල. 04)

II. A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

1. මෙරට ඉදි කොට ඇති මෙම ජලාශය නම් කරන්න.
2. එය කවර ගංගාවක් හා සම්බන්ධ වී ද?
3. මෙම ජලාශය ඉදිකිරීමේ මූලික අරමුණක් ලියන්න.



B

1. මෙම ඓතිහාසික ස්ථානය කුමක් ද?
2. මෙය ඉදිකළ රාජධානි සමය කුමක් ද?
3. මෙම විහාරය කරවූ රජතුමා කවු ද?
4. මෙම රාජධානිය විනාශ වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? (ල. 04 )

## <u>II කොටස</u>

02)

i) අතීතයේ දී ශ්‍රී ලංකාවේ කාසි නිර්මාණය සඳහා යොදාගත් ලෝහ වර්ග තුනක් නම් කරන්න. (ල. 03)

ii) පහත සඳහන් මූලාශ්‍ර රචනා කළ පුද්ගලයින් දක්වන්න.

A. ඩිමුන්ඩෝ -

B. ඉන්ඩිකා -

C. නැචුරාලිස් හිස්ටෝරියා

D. භූගෝල විද්‍යා ප්‍රවේශය (ල. 04)

iii) ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න (ල. 05)

iv) මුල් ඓතිහාසකි යුගයේ ජනාවාස වල ව්‍යාප්තිය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

03)

i) රාජ්‍යත්ව සංකල්ප යටතේ පහත අන්වර්ථ /ගෞරව නාමයෙන් පිදුම්ලත් රජවරුන් නම් කරන්න.

A. අලකපය මහරජ

B. නර ඉසෙර

C. චක්‍රවර්තී (ල. 03)

ii. මධ්‍ය පාලනය හා සම්බන්ධ පහත සඳහන් තනතුරු දැරූ පුද්ගලයන්ගේ නිල නාමයන් මොනවාදැයි ඉදිරියෙන් ලියන්න.

A. නගර ගුත්තික

B. රූප අදෙක

C. අමෙක (ල. 03)

iii) පැරණි කාලයේ මෙරට සමාජ දේශපාලන බලය වර්ධනය වීම සම්බන්ධයෙන් පරුමකවරුන්ගෙන් ඉටු වූ සේවය අති මහත් ය. කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

iv) පළමුවන විජයබාහු රජතුමා පොලොන්නරු යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයෙකි. මේ රජුගේ දේශපාලනික හා ආර්ථික සේවය කරුණු 3 ක් ඇසුරින් විස්තර කරන්න. (ල. 06)

04) i) පහත සඳහන් වැව් ඉදි කරන ලද රජවරුන් නම් කරන්න,

A. ගිරිතලේ වැව

B. තිසා වැව

C. හුරුළු වැව (ල. 03)

ii) පැරණි නගර පරිහානියට බලපෑ හේතු 4 ක් ලියන්න. (ල. 04)

iii) "අපේ මුතුන් මිත්තන් හා රජවරුන් පරිසරයට ආදරය කළ, පරිසරය ආරක්ෂා කළ පිරිසක් වූ බව සත්‍යයකි." ඔවුන් පරිසරය ආරක්ෂා කළ ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

iv) දෙවන නාගරීකරණ අවධියේ මෙරට ආර්ථික රටාවේ ඇති වූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල. 06)

05)

i) පෘතුගීසීන් පැමිණෙන විට ලංකාව බෙදී තිබුණු කොටස් 3 නම් කරන්න. (ල. 03)

ii) පහත A B C D දක්වා ඇති ඓතිහාසික සිද්ධිවලට සම්බන්ධ රජවරුන් / හිමිවරුන් නම් කරන්න.

A. සද්ධර්මරත්නාවලිය රචනා කිරීම

B. ඇම්බැක්ක දේවාලය

C. සපුමල් කුමරු යවා යාපනය ජය ගැනීම.

D. කව් සිළුමිණ රචනා කිරීම (ල. 04)

iii) හයවන පරාක්‍රමබාහු රජුගේ පාලන අවධිය ලංකා ඉතිහාසයේ වැදගත් යුගයක් ලෙස සැලකිය හැක්කේ ඇයි දැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ජනතා අප්‍රසාදයට පත් වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ල. 06)

06)

i) මිෂනාරිවරුන් තම ආගම පැතිරවීමේ දී මාධ්‍ය ක්ෂේත්‍ර තුනක් යොදා ගෙන ඇත. ඒවා නම් කරන්න. (ල. 03)

ii) මෙරට බෞද්ධයින් විසින් පිහිට වූ මුද්‍රණාල හතරක් නම් කරන්න. (ල. 04)

iii) හින්දු ආගමේ පුනර්ජීවනය සඳහා ආරුමුග නාවලර් තුමා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ල. 05)

iv) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට සමාජයේ මධ්‍යම පන්තියක් හා කම්කරු පන්තියක් බිහි විය. නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 06)

07)

i) 1833 කෝල්බෘක් ප්‍රතිසංස්කරණ යෝජනා තුනක් ලියන්න. (ල. 03)

ii) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංසක් රණ යෝජනා හතරක් ලියන්න. (ල. 04)

iii) නිදහසින් පසු කෘෂිකාර්මික සංවර්ධය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග 3 ක් පැහැදිලි කරන්න. (ල. 05)

iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු ලක්ෂණ තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 06)

## III කොටස

08)

i) පුනරුද සමයේ සාහිත්‍යමය වශයෙන් සේවය කළ ගත්කරුවන් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

ii) පහත A, B, C, D යටතේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. අලගියරි ඩාන්ටේ රචනා කළ කාව්‍ය ග්‍රන්ථය

B. පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පය මැනවින් පිළිබිඹු කරන දේවස්ථානය

C. මුද්‍රණ යන්ත්‍රය සොයා ගත් පුද්ගලයා

D. ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා වූ ප්‍රථම යුරෝපා ජාතිකයා
(ල. 04)

iii) යුරෝපයේ පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 05)

iv) නව මුහුදු මාර්ගය සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට සුදුසු පරිසරයක් යුරෝපයේ සකස් වෙමින් තිබුණි. නිදසුන් 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

09)

i) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු ආකාර බහුල ප්‍රදේශ 3ක් ලියන්න. (ල. 03)

ii) කාර්මික විප්ලව සමයේ දී නිපදවූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒවාට සම්බන්ධ පුද්ගලයන් A, B, C, D අනුපිළිවෙලින් ලියන්න.

A ආරක්ෂක ලාම්පුව

B රෝලර් යන්ත්‍රය

C මෝටර් රථය

D 1889 මියුල් යන්ත්‍රය (වාෂ්ප බලයෙන් ක්‍රියා කරන) (ල. 04)

iii) කාර්මික විප්ලවයේ ආර්ථික හා සමාජීය ප්‍රතිඵල සැකවින් විස්තර කරන්න. (ල. 05)

iv) කාර්මික විප්ලවය පේෂකර්මාන්තයේ දියුණුවට කෙසේ බලපෑවේ දැයි කරුණු 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)